# Ālaya Viññānaya is basis for Ālaya - Based on Early Buddhism and Yogācāra Tradition

## ආලය සඳහා පදනම් වන ආලය විඥානය (මුල් බුදුසමය හා යෝගාචාර විඥානවාද සම්ප්‍රදාය ඇසුරෙනි)

Karapikkada Sobitha

"ආලය" යනු බෞද්ධ සාහිත්‍ය තුළ "ඇලීම" සඳහා යෙදී ඇති පර්යාය පදයකි. ආදි බුදුසමය තුළ ආලය යන්නෙන් පුද්ගල මානසිකත්වය තුළ නිර්මාණය වන්නා වූ ක්ලේෂ ග්‍රහණය අර්ථවත් කොට ඇත. **"ආලයරාමා බො පනායං පජා ආලයරතා ආලය සමුදිතා"** මෙම ආලය යන පදයෙහි ගැඹුරු අවස්ථාවක් ලෙස බුදුසමයෙහි "උපාදාන" යන්න යෙදී ඇති අතර, ඒ තුළින් "දැඩිව අල්වා ගැනීම" අර්ථවත් කරයි. එසේම ආදි බුදුසමය තුළ මෙම උපාදාන ක්‍රියාවලිය සිදුවන ආකාරය ද විග්‍රහ වේ. ම. නි. මධුපිණ්ඩික සූත්‍රය තුළ මේ පිළිබඳ පුළුල් වූ විග්‍රහයක් අන්තර්ගතය. මෙහි අවසානය ලෙස දක්වෙන්නේ "ප්‍රපඤ්චකරණය" නම් වූ මානසික තත්වයයි. එනම් පුද්ගලයා තුළ තෘෂ්ණා, දෘෂ්ඨි, මාන යන ක්ලේෂ ධර්ම නිර්මාණයයි. පුද්ගල මමත්වය නිර්මාණය වන්නේ මෙම අවස්ථාව තුළිනි. ආලය යන පදය තුළින් අර්ථවත් වන්නේ ද උක්ත අදහසයි. මෙම ආලය හෙවත් ඇලීම සංසාරගතව පුද්ගලයා කෙරෙහි බැඳී පවතින අතර, එය සිදුවන ක්‍රමවේදයක් ද වේ. ඒ පිළිබඳ අනෙකුත් බෞද්ධ දාර්ශනික සම්ප්‍රදායයන්ට වඩා සෘජු අදහසක් දක්වෙන්නේ යෝගාචාර විඥානවාදි සම්ප්‍රදාය තුළිනි. එනම් ත්‍රිවිධ පරිණාම සංකල්පය තුළිනි. මෙහි දක්වෙන ආලය, මනන හා ප්‍රවෘත්ති යන විඥානත්‍රය මඟින් පුද්ගලයා ක්ලේෂ නිර්මාණය කරගන්නා වූ ආකාරය, ඒවා තැන්පත් කරගන්නා වූ ආකාරය මෙන්ම ඒවා සංසාරගතවන ආකාරය පිළිබඳ විග්‍රහ වේ. මෙම විඥානත්‍රය අතර ආලය විඥානය සුවිශේෂී වේ. එය පුද්ගල අර්හත්වය දක්වා සසර පුරාවට ගමන් කරනු ලබන්නකි. සාගරය මධ්‍යයෙ නිර්මාණය වන්නා වූ තරංගය යම් සේ වෙරළ වෙත පැමිණෙන්නේ ද ආලය විඥානයාගේ ස්වභාවය ද එසේම වේ. එහි පුද්ගලයා සසර තුළ කරනු ලබන ක්‍රියාවන්හි කර්ම බීජ, ක්ලේෂ බීජ, ස්මෘති බීජ තැන්පත්ව පවතී. එම බීජයෝ පුද්ගලයා බාහිර විෂය අරමුණු කෙරේ ඇලීමට ලක් කරයි. ආලය විඥානය "ආදාන විඥානය" ලෙස ද දක්වේ. එනම් සියලු ක්ලේෂයෝ තැන්පත්ව පවත්නා බැවිනි. මෙහි ස්පර්ෂ, මනසිකාර, වේදනා, සංඥා, චේතනා යන චෛතසිකයෝ ද වෙති. ඒ තුළින් ආලය විඥානයාගේ ක්‍රියාකාරීත්වය සිදුවන අතර, මේ සඳහා මනන හා ප්‍රවෘත්ති විඥානයන්ගේ ද දායකත්වය ප්‍රබලව පවතී. එම නිසා මුල් බුදුසමයේ වෛඥානික ක්‍රියාවලියට සමාන වූ ඉගැන්වීමක් යෝගාචාර සම්ප්‍රදාය තුළ ද වන බව සිතිය හැක. නමුත් යෝගාචාරීන්ගේ ආලය විඥාන සංකල්පය තුළ මූලික බෞද්ධ ඉගැන්වීම් වෙනත් අයුරකින් සංවර්ධනය කොට විග්‍රහ කරන අයුරු අධ්‍යයනය කළ හැක.

ප්‍රමුඛ පද ; ආලය, උපාදානය, ප්‍රපඤ්චකරණය, විඥානය, බීජ